# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 ජූලි මස 29 වන දින

## II වන කොටස

## අතිරේකය

(2016. 08. 01 දින නිකුත් කරන ලදී)


# ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

**ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තිමය තත්වය පවත්වාගෙන යාම සහ මෙහෙයවීම සඳහා වගකිවයුතු ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පිහිටුවීම සඳහා ද; ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 21.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

# ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව

එල්. ඩී.— ඕ. 35/2011

**ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තිමය තත්වය පවත්වාගෙන යාම සහ මෙහෙයවීම සඳහා වගකිවයුතු ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පිහිටුවීම සඳහා ද; ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක      දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## 1 වන කොටස

## ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පිහිටුවීම

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පිහිටුවීම.

**2.** (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව ලෙස හැඳින්විය යුතු සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එකී නාමයෙන්, එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය.

සභාවේ සංයුතිය.

**3.** සභාව පහත දැක්වෙන ආකාරයෙන් සමන්විත විය යුතු ය:-

(අ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් හතර දෙනකු නම් වශයෙන් -

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සහ එක් එක් විශ්වවිද්‍යාලය මගින් නම් කරනු ලබන මහාචාර්යවරයකුගේ මට්ටමට අඩු නොවන ඉංජිනේරු පීඨයන්හි පීඨාධිපතිවරු තුන්දෙනකු හෝ ඔවුන්ගේ නාමිකයන්;

2—PL 010081 -425 (2016/07)

(ii) 1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(ආ) (මෙහි මින්මතු ''පත් කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන ආකාරයට අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දහතුන්දෙනකු:-

(i) 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් නම් කරනු ලබන වරලත් ඉංජිනේරුවරුන් හත්දෙනකු;

(ii) 1992 අංක 64 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය මගින් නම් කරනු ලබන සාමාජිකයන් හතරදෙනකු; සහ

(iii) ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සේවාව මගින් නම් කරනු ලබන වරලත් ඉංජිනේරුවරු දෙදෙනකු.

සභාවේ සභාපතිවරයා.

**4.** (1) පත්කළ සාමාජිකයන් අතරින්, වරලත් ඉංජිනේරුවරුන්ගෙන් එක් අයකු අග්‍රාමාත්‍යවරයා විසින් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ අනුමතියක් නොමැතිව, සභාපතිවරයා විසින් ස්වකීය ධුරයේ කාර්යයන්වලින් බැහැරව ගෙවීම් කරනු ලබන යම් රැකියාවක නිරත නොවිය යුතු ය.

(3) සභාපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අග්‍රාමාත්‍යවරයා විසින් එය පිළිගනු ලබන දින සිට බලාත්මක විය යුතු ය.

(4) අග්‍රාමාත්‍යවරයා විසින් හේතු දක්වා, සභාපතිවරයා ධුරයෙන් ඉවත්කරනු ලැබිය හැකි ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය සභාපතිවරයා සභාවේ සාමාජිකයකු ලෙස සිටිනු ලබන කාලසීමාව විය යුතු ය.

(6) රෝගාතුරවීමක්, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමක් හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව ධුරයේ කාර්ය ඉටුකිරීමට සභාපතිවරයාට නොහැකිවන අවස්ථාවක දී අග්‍රාමාත්‍යවරයා විසින්, පත්කළ සාමාජිකයන් අතරින් වෙනත් වරලත් ඉංජිනේරුවරයකු එම පත්කළ සාමාජිකයාගේ සාමාන්‍ය කාර්යයන්ට අතිරේකව සභාපති වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකයන්ගේ මූල්‍ය අයිතිය.

**5.** (1) අග්‍රාමාත්‍යවරයා විසින්, සභාවේ සාමාජිකයකු ලෙස යම් තැනැත්තකු පත් කිරීමට පෙරාතුව, සභාවේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී එම තැනැත්තාට සභාවේ කටයුතු සඳහා අහිතකර ලෙස බලපෑ හැකි පරිදි කිසිදු මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් නොමැති බවට අග්‍රාමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය.

(2) පත්කළ දින සිට සභාවේ කිසිදු සාමාජිකයකු විසින් එවැනි යම් සම්බන්ධතාවක් අත්කරගෙන නොමැති බවට අග්‍රාමාත්‍යවරයා විසින් කලින් කලට සෑහීමට පත් විය යුතු ය.

(3) (අ) සභාව විසින් සිදුකළ හෝ සිදුකිරීමට යෝජිත යම් ගිවිසුමක් සඳහා සභාවේ සාමාජිකයකු සෘජුව හෝ වක්‍රව යම් ආකාරයකින් සම්බන්ධතාවයක් දක්වන අවස්ථාවල දී ස්වකීය සම්බන්ධතාවයේ ස්වභාවය එම සාමාජිකයා විසින් සභාවේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු ය; සහ

(ආ) ඒ හෙළිදරව් කිරීම සභාවේ වාර්තාවල වාර්තා කරනු ලැබිය යුතු අතර, එම සාමාජිකයා එම ගිවිසුම පිළිබඳව සභාවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සභාවේ සාමාජිකයකු" යන්නට, සභාපතිවරයා, පත්කළ සාමාජිකයකු සහ නිල බලයෙන් පත් වන සාමාජිකයකු ඇතුළත් වේ.

සාමාජිකයකු ලෙස පත්වීමට නුසුදුසුකම්.

**6.** යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තුවේ, යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වේ නම් හෝ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ඇ) සභාව විසින් හෝ සභාව වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ සෘජුව හෝ වක්‍රව යම් අයිතිවාසිකම් දරනු ලබයි නම් හෝ යම් වරප්‍රසාදයක් භුක්ති විඳින්නේ නම්;

(ඈ) සභාවේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍යයන් ඔහු විසින් ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවයක් ඇත්නම්;

(ඉ) සභාවේ පූර්ව අනුමතයක් ලබා ගැනීමෙන් තොරව සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට ඔහු පැමිණ නොමැති නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට අනාවරණය කරගෙන හෝ ප්‍රකාශයට පත්කර ඇත්නම්;

(උ) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක බලාත්මක නීතිය යටතේ බුන්වත්භාවයට හෝ බංකොලොත්භාවයට පත්ව ඇති බවට ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති තැනැත්තකු වේ නම් හෝ බුන්වත්භාවයෙන් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් කර නොමැති නම්; හෝ

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත්ව සිටී නම් හෝ යටත්ව සිටිනු ලැබ ඇති නම්,

එම තැනැත්තා සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් දිගටම කටයුතු කිරීමට සුදුස්සෙක් නොවිය යුතු ය.

නිලබලයෙන් පත් වන සාමාජිකයන්.

**7.** සභාවේ නිල බලයෙන් පත් වන සෑම සාමාජිකයකු ම තමා සභාව වෙත පත්කරනු ලැබුවේ යම් ධුරයක් ප්‍රකාරව ද ඔහු විසින් එම ධුරය දරනු ලබන තාක්කල් සභාවේ ධුරය දැරිය යුතු ය.

පත්කළ සාමාජිකයාට අදාළ විධිවිධාන.

**8.** (1) සභාවේ පත්කළ සෑම සාමාජිකයකුම මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් මිස වසර දෙකක කාල සීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර විනය හේතු මත ඉවත් කර ඇති අවස්ථාවක දී හැරුණු කොට නැවත පත්කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(2) අග්‍රාමාත්‍යවරයා විසින් හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) තත්කාර්ය සඳහා අග්‍රාමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක යම් පත්කළ සාමාජිකයකුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අග්‍රාමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(4) (අ) යම් පත්කළ සාමාජිකයකු මියයාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සිදුවන අවස්ථාවක දී, එම නිශ්චිත පත්කළ සාමාජිකයා පත් කිරීමට අදාළ මේ පනතේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් අග්‍රාමාත්‍යවරයා විසින් ඒ තැනැත්තා වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) පුරප්පාඩු සිදු වී එක් මාසයක කාලය ඇතුළත (අ) ඡේදයේ කාර්ය සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ පත්කළ සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වනුයේ යම් සාමාජිකයකුගේ ධුරයක් සඳහා ද, එම සාමාජිකයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(5) අසනීපයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමක් හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට යම්

පත්කළ සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී අග්‍රාමාත්‍යවරයා විසින්, 3 (ආ) වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු වෙනුවට කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) ඉහතින් ම වූ විධිවිධානවලට යටත්ව අග්‍රාමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයා නැවත පත් කරන තෙක් හෝ අග්‍රාමාත්‍යවරයා විසින් අලුත් සාමාජිකයකු පත් කරනු ලබන තෙක්, (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද වසර දෙකක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, පත්කළ සාමාජිකයකු විසින් අඛණ්ඩව ධුරය දැරිය හැකි ය.

**9.** (1) සභාපතිවරයා සභාවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් තැනැත්තකු එම රැස්වීම සඳහා සභාපතිවරයා වශයෙන් තෝරා පත්කර ගත යුතු ය. සභාවේ රැස්වීම්.

(2) (අ) සභාව විසින් තීරණ ගැනීම සඳහා වන සියලු කාරණා සභාවේ රැස්වීමක දී සාකච්ඡා කළ යුතු අතර, එම කරුණ පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයෙන් සහ ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

(ආ) රැස්වීමක දී සලකා බලන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඡන්දය සමාන වන අවස්ථාවක දී එම රැස්වීමේ සභාපතිවරයාට ඔහුගේ මුල් ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(ඇ) හේතුන් පදනම් කරගත් සභාවේ සියලු තීරණ ලිඛිත විය යුතු අතර, සභාවේ මුද්‍රාව එයට තැබිය යුතු ය.

(3) සභාවේ යම් සාමාජිකයකු විසින් ලිඛිත දැන්වීමක් මගින් රැස්වීමක් කැඳවන ලෙසට සභාපතිවරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, සභාපතිවරයා විසින් සාධාරණ හේතු ඇතුව මිස එසේ කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

(4) සභාවේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් සභාවේ කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ ක්‍රියා පටිපාටියක් බල රහිත යයි සලකනු නොලැබිය යුතු ය.

(5) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් නවදෙනකු විය යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට යටත්ව, සභාව විසින්, සභාවේ රැස්වීම්වල සහ එම රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

**10.** (1) සභාවේ මුද්‍රාව සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතු ය. මුද්‍රාව.

(2) සභාවේ මුද්‍රාව -

(අ) සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකු හෝ තැනැත්තන්ගේ භාරයේ තැබිය යුතු ය;

(ඇ) සභාවේ අවසරය නොමැතිව සහ සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට නොසිටින විට දී සභාවේ මුද්‍රාව සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ නොතැබිය යුතු අතර එසේ පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එම සාමාජිකයන් දෙදෙනා විසින් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) සභාව විසින්, සභාවේ මුද්‍රාව තබන ලද ලේඛන පිළිබඳව නිල ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

**11.** මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා, අග්‍රාමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සභාවේ රැස්වීම්වලට සහභාගි වීම වෙනුවෙන් සභාවේ සාමාජිකයන් වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය. සභාවේ රැස්වීම්වලට සහභාගි වීම වෙනුවෙන් වූ පාරිශ්‍රමික.

## II වන කොටස

### සභාවේ බලතල සහ කාර්තව්‍යයන්

සභාවේ කර්තව්‍යයන්.

**12.** මෙහි "අ" උපලේඛනයේ දක්වා ඇති සුදුසුකම් දරන ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ කර්තව්‍යය සභාව විසින් ඉටු කරනු ලැබිය යුතු අතර සහ එසේම -

(අ) මෙම පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා භාරදෙන ලද යම් ඉල්ලුම්පත්‍රයක් පිළිගැනීම, අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම;

(ආ) සභාව විසින් ප්‍රදානය කරන ලද යම් ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම;

(ඇ) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලැයිස්තුවක් තබා ගැනීම, පවත්වාගෙන යාම සහ කලින් කලට ප්‍රකාශනය කිරීම;

(ඈ) ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තිය වැරදි හැසිරීම්වලට අදාළ යම් කාරණා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම;

(ඉ) සභාවේ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම; සහ

(ඊ) ශ්‍රී ලංකාවේ දී ඉංජිනේරු වෘත්තියේ යෙදීම සම්බන්ධයෙන් අදාළ වන කාරණා පිළිබඳව රජයේ කටයුතු සඳහා සහ අදාළ පුද්ගල මණ්ඩල කටයුතු සඳහා නියෝජනයන් සිදු කිරීම,

කළ යුතු ය.

සභාවේ බලතල.

**13.** සභාවට-

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ ලබා දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) සභාවේ කර්තව්‍යය ඉටු කිරීමේ කාර්ය සඳහා මුදල් විෂය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා පනවනු ලැබිය හැකි යම් නියමයන් සහ කොන්දේසි මත ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ලබා ගැනීම;

(ඇ) මුදල් හෝ අන්‍යාකාරයකින් තෑගි, ප්‍රදාන හෝ පරිත්‍යාග පිළිගැනීම, බැහැර කිරීම සහ ඒවා ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා යොදා ගැනීම;

(ඈ) තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම;

(ඉ) ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වන නියම සහ කොන්දේසි තීරණය කිරීම;

(ඊ) තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීමේ ආකෘතිය සහ ආකාරය තීරණය කිරීම;

(උ) ඉංජිනේරු වෘත්තිකයන්ගේ නිල ලේඛනයක් පවත්වාගෙන යාම;

(ඌ) ඉංජිනේරු වෘත්තිකයන් සඳහා වෘත්තීය හැසිරීම් සංග්‍රහයක් සකස් කිරීම;

(එ) ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ ක්‍රියාපටිපාටියක් තීරණය කිරීම; සහ

(ඒ) සභාවේ නිලධරයන් සහ සේවානියුක්තකයන් පත් කිරීම, සේවයේ යෙදවීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ට විරුද්ධව විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම,

සම්බන්ධයෙන් බලතල තිබිය යුතු ය.

## III වන කොටස

### ඉංජිනේරු වෘත්තිකයන් ලෙස ලියාපදිංචි කිරීම

ඉංජිනේරු වෘත්තිකයන් ලෙස මෙම පනත යටතේ ලියාපදිංචි කිරීම.

**14.** (1) කිසිදු ඉංජිනේරු වෘත්තිකයකු 15 වන වගන්තිය යටතේ ඉංජිනේරු වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මිස, එම ඉංජිනේරු වෘත්තිකයා ඉංජිනේරු වෘත්තිය සම්බන්ධ කටයුතුවල නියැලීම සිදු නොකළ යුතු ය:

එසේ වුවද, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී ඉංජිනේරු වෘත්තියේ නියැලෙන යම් ඉංජිනේරු වෘත්තිකයකු වුව ද මේ පනත ක්‍රියාත්මක වන දින සිට මාස හයක් ඇතුළත ඔහු විසින් 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් ඉංජිනේරු වෘත්තිකයකු වරදක් සිදු කරනු ලැබිය යුතු ය.

ඉංජිනේරු වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීම.

**15.** (1) මෙහි "අ" උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සම්බන්ධයෙන් සෑහීමකට පත්වන යම් ඉංජිනේරු වෘත්තිකයකු විසින් තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ආකෘතියකින් සහ ආකාරයකින් ඉංජිනේරු වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිසි පරිදි ඉල්ලුම් කර ඇති යම් ඉංජිනේරු වෘත්තිකයකු තත්කාර්ය සඳහා සාදන ලද රීතිවලින් සභාව විසින් තීරණය කරන ලද ගාස්තු ගෙවීම මත ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු ඇතුළත් වන්නා වූ අදාළ වෘත්තීය මණ්ඩලය විසින් ඉල්ලුම් පත්‍රය ලියාපදිංචිය සඳහා බලය දී ඇතිනම් මිස, ඉංජිනේරු කාර්මිකයකු හැර වෙනත් කිසිදු තැනැත්තකු ඉංජිනේරුවරයකු ලෙස සභාව විසින් ලියාපදිංචි නොකළ යුතු ය.

ලියාපදිංචිය අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

**16.** (1) යම් ඉංජිනේරු වෘත්තිකයකු -

(අ) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ එම ලියාපදිංචිය සම්බන්ධයෙන් වන යම් නියමයන් සහ කොන්දේසි කිසිවක් උල්ලංඝනය කර ඇති බවට;

(ආ) සිහිවිකල් තැනැත්තකු බවට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත නිසි අධිකරණයක් විසින් විනිශ්චයකර ඇති බවට;

(ඇ) සභාව විසින් පවත්වන ලද පරීක්ෂණයකින් පසුව වෘත්තීය වැරදි ක්‍රියාවක් සම්බන්ධව වැරදිකරුවකු ලෙස සොයාගෙන ඇති බවට; හෝ

(ඈ) මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට,

සභාව සෑහීමට පත්වන්නේ නම්, එම ඉංජිනේරු වෘත්තිකයාගේ ලියාපදිංචිය සභාව විසින් අවලංගු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන හේතුවෙන්, ඉංජිනේරු වෘත්තිකයකුගේ ලියාපදිංචිය අවලංගු කිරීමට සභාවට බලය පැවරෙන අවස්ථාවක දී, එම බලය ක්‍රියාත්මක කිරීම වෙනුවට සභාව විසින්, සුදුසු යයි සිතන, කාලසීමාවක් සඳහා එම ලියාපදිංචිය අත්හිටුවනු ලැබිය හැකි ය.

(3) සභාව විසින්, ලියාපදිංචියක් අවලංගු කිරීම හෝ අත්හිටුවීමට පෙරාතුව, අවලංගු කිරීම හෝ අත්හිටුවීම පිළිබඳ දැන්වීමක් එම ඉංජිනේරු වෘත්තිකයා වෙත නිකුත් කිරීමට සැලැස්විය යුතු ය.

(4) එවැනි යම් දැන්වීමක, සභාවේ තීරණයට පදනම් වූ හේතු නිශ්චිතව දැක්විය යුතු අතර, එම දැන්වීම ලැබී මසක් ඇතුළත එම ඉංජිනේරු වෘත්තිකයා විසින් ලියාපදිංචිය අවලංගු කිරීම හෝ අත්හිටුවීම නොකළ යුත්තේ ඇයි ද යන්න පිළිබඳව වූ හේතූන් සභාවට ලිඛිතව භාර දිය යුතු බවට ද එම දැන්වීමේ දැක්විය යුතු ය.

(5) එහි නියම කරන ලද කාලසීමාව තුළ එම ඉංජිනේරු වෘත්තිකයා එකී හේතු භාරදීම පැහැර හරින අවස්ථාවක දී හෝ භාරදෙන ලද යම් හේතුවක් සලකා බැලීමෙන් පසුව, සභාව විසින් එම ඉංජිනේරු වෘත්තිකයාගේ ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකි අතර එම අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව ලිඛිතව එම තැනැත්තාට දැනුම් දෙනු ලැබිය හැකි ය.

(6) වෘත්තීය වැරදි හැසිරීම් ලෙස සලකනු ලබන ක්‍රියා හෝ නොකර හැරීම් අග්‍රාමාත්‍යවරයා විසින් නියෝගවලින් තීරණය කරනු ලැබිය යුතු ය.

**ලුහුඬු පදවි නාම භාවිතය.**

**17.** (1) 15 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති සෑම ඉංජිනේරු වෘත්තිකයකුටම-

(අ) ඔහු වරලත් ඉංජිනේරුවරයකු වේ නම්, ලුහුඬු පදවි නාමය ලෙස "CEng" ;

(ආ) ආශ්‍රිත ඉංජිනේරුවරයකු වේ නම්, ලුහුඬු පදවි නාමය ලෙස"AEng";

(ඇ) අනුබද්ධ ඉංජිනේරුවරයකු වේ නම්, ලුහුඬු පදවි නාමය ලෙස "AflEng";

(ඈ) සංස්ථාගත ඉංජිනේරුවරයකු වේ නම්, ලුහුඬු පදවි නාමය ලෙස "IEng";

(ඉ) ඉංජිනේරු ඩිප්ලෝමාධාරියකු නම්, ලුහුඬු පදවි නාමය ලෙස "EngDip";

(ඊ) ඉංජිනේරු කාර්මිකයකු නම්, ලුහුඬු පදවි නාමය ලෙස "EngTec",

භාවිත කිරීමට අයිතිය තිබිය යුතු ය.

(2) කිසිදු ඉංජිනේරු වෘත්තිකයකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද කිසිදු ලුහුඬු නාමයක් එම ඉංජිනේරු වෘත්තිකයා අදාළ කාණ්ඩයේ ලියාපදිංචි වී ඇත්නම් මිස භාවිත නොකළ යුතු ය.

**විදේශීය ඉංජිනේරුවරුන් ලියාපදිංචි කිරීම.**

**18.** (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානවලට යටත්ව කුමක් සඳහන් වුව ද, විදේශීය ඉංජිනේරු වෘත්තිකයකු, නියමිත සුදුසුකම් සහ නිපුණතාවය දරන බවට සහ ඔහු ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු බවට හෝ ඔහු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වැඩසටහනක විදේශීය හවුල් ව්‍යාපාර අංශයක නේවාසික අනුයෝජිතයකු බවට සභාව සෑහීමට පත් වේ නම් එම විදේශීය වෘත්තිකයා විසින් තාවකාලික ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(2) සභාව විසින් පනවන ලද කොන්දේසිවලට යටත්ව සභාව විසින් මාස හතරක කාලසීමාවක් සඳහා විදේශීය ඉංජිනේරු වෘත්තිකයකුට තාවකාලික ලියාපදිංචියක් නියමිත ගාස්තු ගෙවීමෙන් පසු නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ ලියාපදිංචිය කාල සීමාව අවසානයේ දී තත්කාර්ය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයකින් අලුත් කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### අභියාචනා

අභියාචනා.

**19.** (1) සභාව විසින් 16 (5) වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කර ඇති හෝ අත්හිටුවා ඇති හෝ සභාව විසින් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර ඇති යම් ඉංජිනේරු වෘත්තිකයකු විසින් ඒ තීරණය දැනුම් දී දින තිහක් ඇතුළත 20 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අභියාචනා මණ්ඩලයකට අභියාචනා කරනු ලැබිය හැකි ය.

(2) අභියාචනා මණ්ඩලය විසින්, සියලු අදාළ කරුණු සැලකිල්ලට ගනිමින් සහ එය සුදුසු සහ සාධාරණ අවස්ථාවක දී-

(අ) අභියාචනය කිරීමට අවසර දීම හෝ වෙනස් කිරීම; හෝ

(ආ) අභියාචනය කිරීමට අවසර නොදී සිටීම,

සිදු කළ හැකි ය.

අභියාචනා මණ්ඩලය.

**20.** (1) අග්‍රාමාත්‍යවරයා විසින්,

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද වරලත් ඉංජිනේරුවරයකු විය යුතු එක් සාමාජිකයකුගෙන්;

(ආ) වෙනත් වරලත් ඉංජිනේරුවරු දෙදෙනකුගෙන්; සහ

(ඇ) සංස්ථාගත ඉංජිනේරුවරු දෙදෙනකුගෙන්,

සමන්විත විය යුතු අභියාචන මණ්ඩලයක් පත් කළ යුතු ය.

(2) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් විසින් පත්කළ දිනයේ සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය.

(3) අග්‍රාමාත්‍යවරයා විසින්, අභියාචනා මණ්ඩලයේ රැස්වීම් කටයුතු කරගෙන යා යුතු ආකාරය තීරණය කරමින් අග්‍රාමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(4) අභියාචනා මණ්ඩල විසින් එහි තීරණය සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) අභියාචනා මණ්ඩලයේ තීරණය ලැබුණු පසුව සභාව විසින් නොපමාව අභියාචනා මණ්ඩලයේ තීරණය පිළිබඳ අභියාචකට දැනුම් දිය යුතු අතර, අභියාචනා මණ්ඩලයේ තීරණයට අනුව සභාව ක්‍රියා කළ යුතු ය.

(6) අභියාචන මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව සභාවේ අරමුදලින් යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

V වන කොටස

**සභාවේ විධායක නිලධරයා සහ සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම**

**21.** (1) සභාව විසින් අග්‍රාමාත්‍යවරයා විමසා පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු, ව්‍යාපාර, පරිපාලන, කළමනාකරණ හෝ අදාළ වෙනත් විෂයයන් සම්බන්ධයෙන් ද, උපාධියක් දරන තැනැත්තන් අතරින් (මෙහි මින්මතු "ප්‍රධාන විධායක නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රධාන විධායක නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය. සභාවේ විධායක නිලධරයා පත් කිරීම.

(2) ප්‍රධාන විධායක නිලධරයා, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ඔහු විසින් කලින් ධුරය හිස් කර ඇත්නම් මිස වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර විනය හේතු මත ධුරයෙන් ඉවත් කර නොමැති නම් මිස නැවත එම ධුරය සඳහා පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(3) සභාවේ සාමාන්‍ය විධානයට සහ අධීක්ෂණයට යටත්ව ප්‍රධාන විධායක නිලධරයා-

(අ) පරිපාලනය සහ කාර්ය මණ්ඩලය පාලනය ඇතුළු සභාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය;

(ආ) සභාවේ සියලු තීරණ ඉටුකිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) සභාව විසින් ඔහුට පවරනු ලැබිය හැකි පරිදි යම් සියලු කර්තව්‍යයන් කරගෙන යාම,

කළ යුතු ය.

(4) ප්‍රධාන විධායක නිලධරයාට සභාවේ යම් රැස්වීමකට සහභාගිවීමට සහ කතා කිරීමට හිමිකම් ලැබිය යුතු අතර ඒ රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(5) ප්‍රධාන විධායක නිලධරයා විසින් සභාවේ ලිඛිත අනුමතිය ඇතිව ඔහුගේ බලතල හෝ කර්තව්‍යය කිසිවක් සභාවේ යම් නිලධරයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, ඒ බලතල හෝ කර්තව්‍යය පවරනු ලැබුවේ යම් නිලධරයකුට ද, ඒ නිලධරයා විසින් ඒ බලතල සහ කර්තව්‍යයන් ප්‍රධාන විධායක නිලධරයාගේ විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(6) සභාව විසින් ප්‍රධාන විධායක නිලධරයා -

(අ) ඔහුට අයත් කාර්ය ඉටු කිරීමට ස්ථිරව අපොහොසත් තත්වයට ඔහු පත්ව ඇත්නම්; හෝ

(ආ) සභාවේ මතය අනුව ඔහු විසින් වංචාකාරී හෝ නීති විරෝධී යම් ක්‍රියාවක් සිදු කර ඇතිනම් හෝ සභාවේ සම්බන්ධතාවලට අගතියක් වන යම් ක්‍රියාවක් සිදු කර ඇත්නම්;

(ඇ) සභාව විසින් නිකුත් කළ යම් විධානයන්ට අනුකූල වීම පැහැර හැර ඇත්නම්,

ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) ප්‍රධාන විධායක නිලධරයාගේ මරණය, (6) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කිරීම හෝ සභාව අමතා තත්කාර්ය සඳහා යවන ලිපියක් මගින් ඉල්ලා අස්වීම නිසා ඔහුගේ ධුරය හිස් විය යුතු ය.

(8) ප්‍රධාන විධායක නිලධරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් පවතී නම්, (1) වන උපවගන්තිය යටතේ පත් කිරීමක් සිදු කරන

තෙක් ප්‍රධාන විධායක නිලධරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් සභාවේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ කාර්ය මණ්ඩලය.

**22.** (1) සභාවේ කර්තව්‍යය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සභාව විසින් යම් නිලධරයන් සහ සේවානියුක්තකයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ සභාවට පත්කළ නිලධරයන් සහ සේවානියුක්තකයන් සම්බන්ධයෙන්,

(අ) එම නිලධරයන් සහ සේවානියුක්තකයන් මත හෝ ඔවුන් ඉවත් කිරීම සඳහා විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ආ) රජයේ මාර්ගෝපදේශවලට අනුව එම නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණයක් නියම කිරීම;

(ඇ) එම නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි තීරණය කිරීම; සහ

(ඈ) එම නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සුභසාධන කටයුතු සඳහා සේවක සුභසාධන සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ එම යෝජනා ක්‍රමයන්ට දායක වීම,

සභාව විසින් කළ හැකි ය.

(3) සභාව විසින් (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද කාරණා සියල්ල හෝ කිසිවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(4) කෙසේ වුවත්, සභාව විසින් රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ කලින් දරන ලද යම් තනතුරකින් ඉවත් කර ඇති යම් තැනැත්තකු සභාවේ නිලධරයකු හෝ සේවානියුක්තයකු ලෙස පත් නොකළ යුතු ය.

රාජ්‍ය නිලධරයන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කළ යුතු බව.

**23.** (1) සභාවේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ එම නිලධරයා සේවයේ නියුතුව සිටින්නේ යම් අමාත්‍යාංශයක් යටතේ ද, එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ

ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කර ඇති අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 14(2) වන වගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කර ඇති අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 14(3) වන වගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගනු ලැබිය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීම සඳහා එකඟ වී ගිවිසුමකට එළඹී ඇති යම් තැනැත්තකු සභාව විසින් සේවයේ යොදවන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් සභාවේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුම යටතේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට සිදු කරන ලද සේවාවන් ලෙස සලකනු ලැබිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා.

**24.** (1)සභාව විසින්, රෙජිස්ට්‍රාර්වරයා ලෙස වරලත් ඉංජිනේරුවරයකු පත්කළ යුතු අතර ඔහු සභාවේ ලේකම්වරයා ද විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ පත් කරන ලද රෙජිස්ට්‍රාර්වරයා සභාවේ සාමාජිකයකු නොවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛනයක් පවත්වා ගෙන යා යුතු බව.

**25.** රෙජිස්ට්‍රාර්වරයා විසින්, මේ පනතේ විධිවිධානවලට සහ මේ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව මෙහි ඇතුළත් "ආ" උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

## VI වන කොටස

## මුදල්

සභාවේ අරමුදල්.

**26.** (1) සභාවට එහි අරමුදලක් තිබිය යුතු ය.

(2) සභාවේ අරමුදලට -

(අ) සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට වෙන් කරනු ලැබිය හැකි යම් සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනත යටතේ සභාවේ බලතල සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සභාවට ලැබුණු සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව යම් මූලාශ්‍රවලින් ණය, ප්‍රදාන සහ පරිත්‍යාග ලෙස සභාවට ලැබුණු යම් සියලු මුදල් ප්‍රමාණයන්,

බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ සභාවේ බලතල සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සභාව විසින් දරන ලද වියදම් පියවා ගැනීමට අවශ්‍ය කරන සියලු මුදල් ප්‍රමාණයන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සභාව විසින් ගිණුම් පවත්වාගෙන යා යුතු බව.

**27.** සභාව විසින්, එය සුදුසු යයි සිතන යම් රාජ්‍ය බැංකුවක යම් ගිණුමක් ආරම්භකර පවත්වාගෙන යා හැකි අතර, එම ගිණුම් රජයේ සංස්ථාවල මුදල් ගනුදෙනුවලට අදාළව රජයේ පවතින මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**28.** (1) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතු ය.

(2) සභාව විසින්, සභාවේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ සභාවේ අනෙකුත් සියලු මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සභාවේ මූල්‍ය කාර්යසාධන සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ ලෙස නිරූපනය කිරීමේ කාර්ය සඳහා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් අනුගමනය කරනු ලබන ශ්‍රී ලංකාවේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සභාව විසින් ගිණුම් සකස් කළ යුතු ය.

(4) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

අරමුදල් ආයෝජනය.

**29.** සභාවට අයත් වන මුදල්, අග්‍රාමාත්‍යවරයාගේ අනුමතය සහ මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව රජයේ අනුමත සුරැකුම්පත්වල ආයෝජනය කරනු ලැබිය හැකි ය.

ණය ගැනීමට සභාවේ ඇති බලතල.

**30.** (1) සභාව විසින්, අග්‍රාමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ ලිඛිත කැමැත්ත ඇතිව සහ දෙන ලද යම් පොදු අවසරයක නියමයන්ට අනුකූලව, සභාවේ වගකීම් සපුරාලීම සඳහා සභාව විසින් නියම කරනු ලැබිය හැකි පරිදි යම් මුදලක්, ණය නියමය මත ණයට ගැනීම හෝ ලබා ගැනීම කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සභාව විසින් ලබාගන්නා යම් ණය මුදලක් සම්බන්ධයෙන් ගෙවීමට තිබෙන හිඟ මුදල්වල එකතුව කිසිදු අවස්ථාවක දී අග්‍රාමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

## **VII** වන කොටස

### සාමාන්‍ය

වාර්ෂික වාර්තා.

**31.** (1) සභාව විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක කාලයක් ඇතුළත එම මුදල් වර්ෂය තුළ සභාව විසින් කරගෙන යන ලද කාර්ය පිළිබඳ වාර්ෂික වාර්තාවක් අග්‍රාමාත්‍යවරයා වෙත භාර දිය යුතු අතර එම වර්ෂයට අදාළව පහත දැක්වෙන එක් එක් ලේඛනවලින් පිටපත බැගින් වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා සභාවේ විගණනය කරන ලද ගිණුම්;

(ආ) එම වාර්තා සහ ගිණුම් අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය සඳහා යෝජිත කර්තව්‍යය පිළිබඳ වාර්තාවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද වාර්තා සහ ලේඛන ලැබුන දින සිට මාස හයක කාලයක් ඇතුළත එම වාර්තා හා ලේඛනවල පිටපත් අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

රහස්‍යභාවය පිළබඳ ප්‍රකාශය.

**32.** සභාවේ සෑම සාමාජිකයකුම සහ සභාවේ සෑම නිලධරයකුම සහ සේවානියුක්තකයකුම විසින් ස්වකීය කාර්ය භාර ගැනීමට පෙරාතුව මේ පනත යටතේ තම බලතල සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන සභාවේ කටයුතුවලට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය රැකීමට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර එම ප්‍රකාශය මගින් තමාට දැනගැනීමට ලැබෙන කිසිම එවැනි ම තොරතුරක් -

(අ) අධිකරණ නීතියක් විසින් එසේ කිරීමට නියම කර ඇති විට; හෝ

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලතල සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ හෝ ඉටු කිරීමේ කාර්යයන් සඳහා,

යන අවස්ථාවල දී හැර එවැනි යම් කිසිදු කාරණයක් හෙළිදරව් නොකිරීමට ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

සභාවේ බලතල පැවරීම.

**33.** (1) සභාව විසින් එහි බලතල හෝ කර්තව්‍යය කිසිවක් ලිඛිතව සහ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව ප්‍රධාන විධායක නිලධරයාට හෝ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි අතර එවැනි යම් නිලධරයකු විසින් සභාවේ නාමයෙන් සහ සභාව වෙනුවෙන් එම බලතල හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, සභාව විසින් එසේ පවරන ලද යම් බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි අතර සහ එවැනි යම් පැවරීමක් ඕනෑම අවස්ථාවක අවලංගු කරනු ලැබිය හැකි ය.

අග්‍රාමාත්‍යවරයා විසින් විධාන නිකුත් කළ හැකි බව.

**34.** (1) අග්‍රාමාත්‍යවරයා විසින් කලින් කලට සභාවේ බලතල සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අදාළව යම් සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන ලිඛිතව සභාවට නිකුත් කරනු ලැබිය හැකි අතර එම විධිවිධානවලට බලාත්මකභාවයක් ලබා දීම සභාවේ කාර්ය විය යුතු ය.

(2) නියම කරනු ලබන ආකෘතිපත්‍ර ප්‍රකාරව සභාවේ කටයුතුවලට අදාළ වාර්තා, ගිණුම් සහ වෙනත් යම් තොරතුරු අග්‍රාමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙසට අග්‍රාමාත්‍යවරයා විසින් සභාවට විධාන කරනු ලැබිය හැකි අතර එම විධානවලට බලාත්මකභාවයක් ලබා දීම සභාවේ කාර්ය විය යුතු ය.

සභාවේ නිලධරයන් සහ සේවානියුක්තකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**35.** දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා සභාවේ ප්‍රධාන විධායක නිලධරයා සහ නිලධරයන් සහ සේවානියුක්තකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සභාව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**36.** අල්ලස් පනතේ අර්ථානුකූලව සහ එම කාර්ය සඳහා සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

යම් සිවිල් හෝ අපරාධ නඩුවක වියදම් අරමුදලින් ගෙවිය යුතු බව.

**37.** (1) යම් අධිකරණයක් ඉදිරියේ දී සභාව විසින් හෝ සභාවට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී සභාව විසින් දරන ලද යම් වියදම් සභාවේ අරමුදලින් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී සභාවට ගෙවන ලද හෝ සභාව විසින් අය කර ගත් යම් පිරිවැයක් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ හෝ සභාවේ විධාන මත සභාවේ සාමාජිකයකු ප්‍රධාන විධායක නිලධරයා හෝ යම් නිලධරයකු හෝ සේවානියුක්තකයකු විසින් සිදු කරන ලද හෝ සිදු කරනු ලදැයි අනුමාන කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් ඉදිරිපිට දී එම තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී එම ක්‍රියාව එකී තැනැත්තා විසින් සිදු කරනු ලැබුවේ සද්භාවයෙන් බවට එම අධිකරණය විසින් තීරණය කරයි නම් සහ එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම

තැනැත්තා විසින් දරන ලද වියදම් එම තැනැත්තා විසින් යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තකින් අය කර ගෙන ඇත්නම් මිස එකී වියදම සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

**නියෝග.**

**38.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනත මගින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අග්‍රාමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අග්‍රාමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එම පළ කරන ලද දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක දී ක්‍රියාත්මක භාවයට එළඹිය යුතු ය.

(3) (අ) අග්‍රාමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) එසේ පරිච්ඡින්න කළ යුතු බවට සලකමින් අග්‍රාමාත්‍යවරයා විසින් යම් නියෝගයක් සිදු කරනු ලද දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**රීති.**

**39.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සභාව විසින්, මේ පනත යටතේ සාදනු ලැබීමට බලය දෙන ලද හෝ නියම කරන ලද රීති සඳහා වන සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව සභාව විසින් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(අ) ඉංජිනේරු වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු;

(ආ) සභාවේ රැස්වීම්වල ක්‍රියාපටිපාටිය;

(ඇ) සභාවේ නිලධරයන් සහ සේවානියුක්තකයන් පත් කිරීම, සේවය අත්හිටුවීම, ඉවත් කිරීම, කාර්ය සහ පාරිශ්‍රමික;

(ඈ) මේ පනතේ විධිවිධාන ඉටුකිරීමේ දී ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම සඳහා;

(ඉ) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ඉංජිනේරු වෘත්තිකයන්ගේ විවිධ කාණ්ඩවල කාර්ය භාරය, වගකීම සහ දක්ෂතාවය පිළිබඳව;

(ඊ) ඉංජිනේරු වෘත්තිකයන්ගේ ලේඛනයෙන් නම් අත්හිටුවීම සහ ඉවත් කිරීම සඳහා; සහ

(උ) ලේඛන පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳව.

(3) සභාව විසින් සාදන ලද සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වැරදි සහ දඬුවම්.

**40.** (1) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද වෙනත් යම් නියෝගයක් උල්ලංඝනය කරනු ලබන සෑම තැනැත්තකු ම වරදක් සිදු කරන ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් වරදකරු කිරීමෙන් පසුව වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදුකරන අවස්ථාවක දී, ඒ පුද්ගල මණ්ඩලය -

(අ) සංස්ථාපිත මණ්ඩලයක් වන්නේ නම්, එම සංස්ථාපිත මණ්ඩලයේ සියලු අධ්‍යක්ෂවරුන් හෝ වෙනත් නිලධරයකු;

(ආ) ආයතනයක් වේ නම්, එම ආයතනයේ සෑම කොටස්කරුවකු ම; සහ

(ඇ) ආයතනයක් නොවන සංස්ථාපිත නොවන පුද්ගල මණ්ඩලයක් නම් එම පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු ම සහ එම පුද්ගල මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සඳහා වගකිවයුතු ඒ පුද්ගල මණ්ඩලයේ සෑම නිලධරයකු ම,

වරදකට වරදකරු විය යුතු යඃ

එසේ වුව ද, එම තැනැත්තා ඔහුගේ දැනීමෙන් තොරව එම වරද සිදු කළ බවට හෝ එම වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි උද්‍යෝගයෙන් ඔහු ක්‍රියා කළ බවට ඔහු විසින් ඔප්පු කරන්නේ නම් එවැනි කිසිදු තැනැත්තකු වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

**41.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි - අර්ථ නිරූපනය.

"ඉංජිනේරු වෘත්තිකයා" යන්නෙන්,

(අ) වරලත් ඉංජිනේරුවරයකු;

(ආ) ආශ්‍රිත ඉංජිනේරුවරයකු;

(ඇ) අනුබද්ධ ඉංජිනේරුවරයකු;

(ඈ) සංස්ථාගත ඉංජිනේරුවරයකු;

(ඉ) ඉංජිනේරු ඩිප්ලෝමාධාරියකු;

(ඊ) ඉංජිනේරු කාර්මිකයකු,

වශයෙන් මෙහි "අ" උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුරූපී සුදුසුකම් දරන තැනැත්තකු අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියම කිරීමක් අදහස් වේ.

**42.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

(15 වන වගන්තිය)

''අ'' උපලේඛනය

**ඉංජිනේරු වෘත්තිකයන්ගේ සුදුසුකම්**

| **ඉංජිනේරු වෘත්තිකයා** | **සුදුසුකම්** |
|---|---|
| වරලත් ඉංජිනේරුවරයකු | 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ වරලත් ඉංජිනේරුවරයකු වීම සහ සභාව විසින් පිළිගෙන තිබීම. |
| ආශ්‍රිත ඉංජිනේරුවරයකු | 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වසර හතරක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධිය හෝ 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වීම සහ සභාව විසින් පිළිගෙන තිබීම. |
| අනුබද්ධ ඉංජිනේරුවරයකු | 1968 අංක 17 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වසර තුනක පූර්ණ කාලීන ඉංජිනේරු උපාධියක් ලබා තිබීම සහ සභාව විසින් පිළිගෙන තිබීම. |
| සංස්ථාගත ඉංජිනේරුවරයකු | 1992 අංක 64 දරන ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සංස්ථාපිත ආයතනයේ සංස්ථාපිත ඉංජිනේරුවරයකු වීම සහ සභාව විසින් පිළිගෙන තිබීම. |
| ඉංජිනේරු ඩිප්ලෝමාධාරියකු | 1992 අංක 64 දරන ශ්‍රී ලංකා සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් පිළිගත්, පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ තාක්ෂණ හෝ තාක්ෂණ විද්‍යා ආයතනයෙන් ඉංජිනේරු ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ සභාව විසින් පිළිගෙන තිබීම. |
| ඉංජිනේරු කාර්මිකයකු | (i) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ විද්‍යා ඉංජිනේරු iv වන මට්ටම ජාතික වෘත්තීය සුදුසුකම් හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම සහ සභාව විසින් පිළිගැනීම.<br>(ii) ඉංජිනේරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ වසර එකක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාවක් හදාරා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර එකක කාර්මික පළපුරුද්දක් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා රජයේ විශ්ව විද්‍යාලයකින් හෝ තාක්ෂණික හෝ තාක්ෂණ විද්‍යා ආයතනයකින් තාක්ෂණ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සහතිකයක් දරන්නකු වීම සහ සභාව විසින් පිළිගෙන තිබීම. |

**(25 වන වගන්තිය)**

"ආ" උපලේඛනය

**ඉංජිනේරු වෘත්තිකයන් පිළිබඳ ලේඛනය**

I කොටස

**වරලත් ඉංජිනේරුවරයන්, ආශ්‍රිත ඉංජිනේරුවරයන් සහ අනුබද්ධ ඉංජිනේරුවරයන්ගේ ලේඛනය**

| ලියාපදිංචි අංකය | නම | ලිපිනය | ලියාපදිංචි දිනය | සුදුසුකම් | ලියාපදිංචි කිරීමේ ගාස්තු |
|---|---|---|---|---|---|
| | | | | | |

II කොටස

**සංස්ථාගත ඉංජිනේරුවරුන්ගේ සහ ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන්ගේ ලේඛනය**

| ලියාපදිංචි අංකය | නම | ලිපිනය | ලියාපදිංචි දිනය | සුදුසුකම් | ලියාපදිංචි කිරීමේ ගාස්තු |
|---|---|---|---|---|---|
| | | | | | |

III කොටස

**ඉංජිනේරු කාර්මිකයන්ගේ ලේඛනය**

| ලියාපදිංචි අංකය | නම | ලිපිනය | ලියාපදිංචි දිනය | සුදුසුකම් | ලියාපදිංචි කිරීමේ ගාස්තු |
|---|---|---|---|---|---|
| | | | | | |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.